# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 990/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 12/06/2024<br>පැය 1910 |

**මාධ්‍ය නිවේදනය**

### පොලිස්පති විශේෂ ත්‍යාග ප්‍රදානෝත්සවය

අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ රාජකාරි ඉටු කරන ලද පොලිස් නිලධාරීන්ට සහ ශ්‍රී ලංකා පොලිසියට කීර්තියක් අත් කර දෙමින් වසර 33 කට පසු ක්ලිෆර්ඩ් කුසලාන රගර් තරඟයේ ශූරතාවය ජයග්‍රහණය කරන ලද නිලධාරීන් ඇතුළු විශිෂ්ඨ ලෙස තම රාජකාරීය ඉටු කරන ලද පොලිස් නිලධරයින් 459ක් හා අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා තොරතුරු සපයන ලද පුද්ගලික ඔත්තුකරුවන්ගේ සේවය අගයමින් ඔවුන් සඳහා පොලිස්පති ත්‍යාග අරමුදලින් රුපියල් දෙකෝටි පනස්නව ලක්ෂ තිස්හත් දහස් පන්සීයක (25,937,500/=) මුදලක් සහ පොලිස්පති ප්‍රශංසා ප්‍රදානය කිරිමේ උත්සවයක් 2024.06.12 වන අද දින ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහජන ආරක්ෂක ලේකම් වියානි ගුණතිලක මහතා හා පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගීත්යවයෙන් බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලේ 19 වන මහලේ පිහිටි මහජන ආරක්ෂක අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි .

**මේ අවස්ථාවෙදී යහපත් සේවය අගයා සංකේතාත්මකව නිලධාරීන් 232ක් සඳහා මුදල් රුපියල් එක්කෝටි අනූහතර ලක්ෂ හැත්තෑහය දහස් දෙසිය පනහක (19,476,250/=) මුදලක් ප්‍රදානය කරන ලද අතර පුද්ගලික ඔත්තුකරුවන් 16 දෙනෙකු සඳහා ද මෙම අවස්ථාවේදී මුදල් ත්‍යාග පිරිනමන ලදි.** තවද වැලිඔය පොලිස් වසමේ දී කුඩා දරුවෙකුට පහර දීමේ සිදුවීම වීඩියෝගත කර සැකකරු අනාවරණය කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම වෙනුවෙන් එම තරුණයාට මෙහිදී මුදලින් රුපියල් ලක්ෂ පහක (500,000 /= ) ත්‍යාග ප්‍රදානය කරන ලද අතර එම වින්දිත දැරිය වෙත බැංකු ගිණුමක් විවෘත කර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වන අනුර බැස්ටියන් මහතා විසින් රුපියල් දෙලක්ෂ පනස්දහසක (250,000/=) ක මුදල් ත්‍යාගයක් පිරිනමන ලදි. සෙසු නිලධාරීන් සඳහා ත්‍යාග මුදල් සහ පොලිස්පති ප්‍රශංසා පිරිනැමීම පොලිස් කොට්ඨාස මට්ටමින් සිදු කිරීමට නියමිතයි.

මෙම අවස්ථාව සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් ඉලුක්පිටිය මහතා, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් ප්‍රදීප් සපුතන්ත්‍රී

මහතා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් සංජීව විමල ගුණරත්න මහතා හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිසපති අපරාධ හා රථ වාහන දිසාව භාර රන්මල් කොඩිතුවක්කු මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහයක සේවා රාජිත ශ්‍රී දමින්ද මහතා , නියෝජ්‍ය පොලිස්පති සංචාරක හා ආයෝජන දිසාව භාර අසංග කරවිට මහතා, නියෝජ්‍ය පොලිස්පති අපරාධ දිසාව හා මාධ්‍ය ප්‍රකාශක නීතිඥ නිහාල් තල්දූව මහතා සහ කාන්ත් නියෝජ්‍ය පොලිස්පති ළමා හා කාන්තා අපයෝජන නිවාරණ දිසාව භාර රේණුකා ජයසුන්දර මහත්මිය ඇතුළු රාජ්‍ය නිවේදිත නිලධාරීන් හා ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් රැසක් සහභාගී විය.